

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
சமுத்திர பல்கலைக்கழகம்
The Ocean University of Sri Lanka

2020

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report



නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

திறன்கள்அபிவிருத்தி, தொழில்முறைஆய்வு, ஆராய்ச்சிமற்றும்புத்தாக்கஇராஜாங்கஅமைச்சு

State Ministry of Skills Development, Vocational Education, Research and Innovation

වාර්ෂික වාර්තාව හා ගිණුම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2020

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

අංක : 15, කාක දුපත, මට්ටක්කුලිය, කොළඹ 15.

දුරකථන - 011-4346973 ෆැක්ස් - 011-2525103

විද්‍යුත් තැපෑල : oceanuniversity@ocu.lk

අන්තර්ජාලය : www.ocu.lk

පටුන

01. උපකුලපති පණිවුඩය

02. පාලන මණ්ඩලය සහ සංයුතිය

03. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය

04. ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ ආරම්භය , විකාශය , අරමුණු

05. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, කාර්යභාරය,සේවා දායකත්වය

06. උසස් අධ්‍යයන අංශය

07. පුහුණු අංශය

08. පාලන අංශය

09. අභ්‍යන්තර විගණන අංශය

10. ශේෂ පත්‍රය සහ ආදායම් වියදම් ගිණුම්

11. විගණකාධිපති වාර්තාව

12. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

01. උපකුලපති පණිවුඩය.

2020 වර්ෂයේ දී සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්තිය යටතේ පුහුණුව තුළින් නිපුණතාව ඔප් නැංවූ ශ්‍රම බලකායක් සහ ධීවර, සාගර සහ සමුද්‍රීය කටයුතු, කළමණාකරන, සහ නාවික ඉංජිනේරු යන ක්ෂේත්‍රවල විශේෂඥ මානව සම්පත් සැපයීමේ වෘත්තීය හා උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට විශේෂී කාර්යභාරයක් ඉටු කිරීමට හැකි වීම විශ්වවිද්‍යාලය ලැබූ ජයග්‍රහණයක් ලෙස සලකමි. ධීවර,නාවික, කළමණාකරන සහ සාගර/සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සම්පත් බිහි කිරීමත් එකී ක්ෂේත්‍රවල නියලී සිටින්නන්ගේ විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමණාකරණ නිපුණතා වැඩි දියුණු කිරීමට ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව අදාල ක්‍රියාකාරකම් ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ව්‍යුහාත්මක හා ප්‍රතිපත්තිමය වෙනස්කම් රාශියක් සිදු කිරීමටත් නව ප්‍රතිපත්ති ඇතුළත් පස්අවුරුදු සංයුක්ත සැලසුම ක්‍රියාත්මක කිරීමටත් මෙම වර්ෂයේ දී විශ්වවිද්‍යාලයට හැකිවිය.

මෙම කාලසීමාව තුළදී ඉංජිනේරු හා කළමනාකරණ පීඨයට, ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨයට පීඨාධිපතිවරුන් පත් කිරීම, පීඨ මණ්ඩල ඇති කිරීම,ඇතුළත් කිරීම්, ප්‍රතීතන හා තත්ත්ව සහතික කිරීම් සභාවේ අධ්‍යක්ෂක පත් කිරීම, පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව පිහිටුවීම හා ප්‍රතිපත්ති සම්පාදන කමිටුව පිහිටුවීම සිදු කරන ලද අතර, කාර්ය මණ්ඩලයේ අභියාචනා සොයා බලා විසඳුම් ලබා දීමට අභියාචනා මණ්ඩලයක් ද පිහිටුවීමට ක්‍රියා කරන ලදී.

2019 වර්ෂයේ දී ආරම්භ වූ කොවිඩ් -19 වසංගත තත්ත්වය අභියෝගයක් වුවද ප්‍රායෝගික පුහුණුව මත පදනම්වූ පාඨමාලා රැසකට මෙන්ම උසස් අධ්‍යාපන අංශයේ උපාධි පාඨමාලා සඳහා ද කෙටි කාලයක් තුළ දී මෘදුකාංග භාවිතයෙන් මාර්ගගත තාක්ෂණ ක්‍රම හඳුන්වා දී දේශකයන්, සිසුන් මෙන්ම සෙසු කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පහසුකම් සහ පුහුණුව ලබා දෙමින් අධ්‍යයන සහ පරිපාලන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යමින් වසර තුළ සැළසුම් කරන ලද ඉලක්ක බොහෝමයක් අත්පත් කර ගැනීමටත් අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමටත් හැකි විය.

නව උපාධි පාඨමාලාවක් හඳුන්වා දීමටත් පාඨමාලා සඳහා ශිෂ්‍ය බඳවා ගැනීම් පෙර වසරට සාපේක්ෂව 30% කින් වැඩි කිරීමට හැකි වූ අතර වෘත්තීය පුහුණු පාඨමාලා ජාතික වෘත්තීය නිපුණතා මට්ටම් (NVQ Level 3,4 සිට7) දක්වා හඳුන්වා දීමට සහ ඒ සඳහා විෂය නිර්දේශ සකස් කොට අදාළ අනුමැතීන් ලබා ගැනීමට ද මෙම වර්ෂය තුළ දී හැකි විය. විශ්වවිද්‍යාලයට අවශ්‍ය භෞතික සම්පත් නොතිබීමේ ගැටලුව විසඳා ගැනීම සඳහා කොරියානු ආධාර යටතේ යෝජිත විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය කඩිනම් කොට භෞතික පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය සැළසුම් සකස් කර (Master Plan) ජාතික ක්‍රමසම්පාදන අංශයට (National Planning Division) ඉදිරිපත් කර අනතුරුව පාරිසරික ශක්‍යතා අධ්‍යනය සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකිවීම ද වසර තුල ලබාගත් වැදගත් සාධනීය තත්ත්වයකි.

අභ්‍යන්තර විගණන අංශයෙන් ලද මහ පෙන්වීම ද විශ්වවිද්‍යාලයීය අධ්‍යයන පරිපාලන මූල්‍ය පද්ධතීන් හී දෝෂ සහගත තත්ත්වයන් අවම කර වසර තුළදී මනා ක්‍රියාකාරිත්වයකින් සියලුම අංශ පවත්වා ගෙන යාමට උපකාරී වූ බව ද සටහන් කළ යුතු වේ.රාජ්‍ය මුදල් නිසි පරිදි කළමනාකරණය කර මූල්‍ය විනය පවත්වා ගෙනයාමේ කාර්යභාරය නිසි ලෙස සිදු කර ඇති බවට පෙන්නුම් කරනු ලබන විගණිත මූල්‍ය ගිණුම් සඳහා ජාතික විගණන කාර්යාලයෙන් ලද විගණන මතය ද මෙහිදී සඳහන් කළ යුතු වේ.

ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් වැඩිදියුණු කිරීමේදී සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන පාඨමාලා විශේෂී වන අතර, බිහි කරන පුහුණු ශ්‍රමිකයන් සහ විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ඇති මානව සම්පත් දේශීය සහ විදේශීය ශ්‍රම වෙළඳපොළට ඉදිරිපත් කිරීම මඟින් ආර්ථික වර්ධනය ඉහළ නැංවීම විශ්වවිද්‍යාලයේ වගකීම වේ. ඒ අනුව, වසරින් වසර ආයතනයේ කාර්ය සහ කර්තව්‍ය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකවත් ඉහළ දැමීමට අවශ්‍ය වන අතර, එමඟින් වෘත්තීය අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය ලබා දීමේ ප්‍රමුඛ ආයතනයක් බවට පත්වීමට විශ්වවිද්‍යාලයට හැකි වෙනු ඇත. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේදී 2020 වසර අභියෝගත්මක වසරක් වුව ද බෝහෝමයක් ජයග්‍රහණ සඳහා කැපවීමෙන් ක්‍රියාකළ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙත මාගේ ප්‍රණාමය පිරිනැමීමට ද කැමැත්තෙමි.



මහාචාර්ය ඒන්.පී. රත්නායක

උපකුලපති

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

02. පාලන මණ්ඩල සංයුතිය.

01.	මහාචාර්ය එන්.ජී. රත්නායක මහතා	උපකුලපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (සභාපති)
02.	ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	පීඨාධිපති, ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය (පාලන මණ්ඩල සාමාජික)
03.	ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	පීඨාධිපති, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය (පාලන මණ්ඩල සාමාජික)
04.	සී. ජයසුරිය මහතා	අතිරේක ලේකම්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
05.	ඩබ්.එස්. සත්‍යානන්ද මහතා	අධ්‍යක්ෂ රාජ්‍ය මූල්‍ය අමාත්‍යාංශය, මුදල් දෙපාර්තමේන්තුව, (පාලන මණ්ඩල සාමාජික)
06.	රූපිකා ප්‍රියදර්ශනී මහත්මිය	අධ්‍යක්ෂ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
07.	ඉංජිනේරු ඩී.වී. අබේසිංහ මහතා	පාලන මණ්ඩල සාමාජික, කොළඹ නැව් තාටාකාංගනය
08.	මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා	සභාපති, ජාතික විද්‍යා පදනම (පාලන මණ්ඩල සාමාජික)
09.	ආර්.ඒ.ඩී.එස්. රණතුංග මහතා	අධ්‍යක්ෂ ජනරාල්(තාක්ෂණික), ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
10.	දමිත් වික්‍රමසිංහ මහතා	සභාපති, වෘත්තීය පුහුණු අධිකාරිය
11.	මහාචාර්ය නවරත්නරාජා	සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (පාලන මණ්ඩල සාමාජික)
12.	තරංග නලීන් ගම්ලත් මහතා	සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
13.	ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මහතා	අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.), තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
14.	ඉංජිනේරු සනත් පනවෙන්නගේ	පාලන මණ්ඩල සාමාජික,සහකාර අධ්‍යක්ෂ, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
15.	අජිත් සෙනෙවිරත්න මහතා	පාලන මණ්ඩල සාමාජික,අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ නාවික ලේකම් කාර්යාලය
16.	ආරියසීල වික්‍රමනායක මහතා	පාලන මණ්ඩල සාමාජික
17.	ආරියසිරි විතානගේ මහතා	පාලන මණ්ඩල සාමාජික
18.	හෙක්ටර් හේමචන්ද්‍ර මහතා	පාලන මණ්ඩල සාමාජික
19.	සාලිය වික්‍රමසුරිය මහතා	පාලන මණ්ඩල සාමාජික
20.	හේමන්ත රත්නායක මහතා	ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (ලේකම්)

03. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය.

01.	මහාචාර්ය එන්.පී. රත්නායක මහතා (සභාපති)	උපකුලපති
02.	හේමන්ත රත්නායක මහතා (ලේකම්)	ලේඛකාධිකාරී
03.	ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	පීඨාධිපති, ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය
04.	ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	පීඨාධිපති, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය
05.	පී.යූ.අයි. පෙරේරා මහතා	අධ්‍යක්ෂ (පුහුණු)
06.	එච්.කේ.ආර්. තුෂාර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
07.	ආචාර්ය චම්පා අමරසිරි මහත්මිය	උසස් අධ්‍යයන අංශ උපදේශිකා
08.	නිශාන්ති සේපාලිකා මිය	උසස් අධ්‍යයන අංශ උපදේශිකා
09.	ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී
10.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී
11.	එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී
12.	ඩී.එස්. මානගේ මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී
13.	ශ්‍යාමලි රත්න ශ්‍රී මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානි
14.	ආචාර්ය එම්.පී. කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
15.	එන්. දුෂානි මහත්මිය	කථිකාචාර්ය
16.	නිසඟ නුවන්ත මහතා	කථිකාචාර්ය

04. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය හා අරමුණු.

ශ්‍රී ලංකාවේ ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දැනුම ලබා දී රටේ සංවර්ධනය උදෙසා දායකත්වය දීමේ කාර්යභාරය 2014 අංක 31 දරන පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය දක්වා වූ ගමනේ මූලාරම්භය සටහන් වනුයේ මීගමුව ප්‍රදේශයෙනි. 1963 වර්ෂයේදී මීගමුව ධීවර පුහුණු ආයතනය වශයෙන්ද, 1972 වර්ෂයේදී තංගල්ල, මඩකලපුව, යාපනය ප්‍රදේශ වලින් ආරම්භ වී 1975 වර්ෂයේ මට්ටක්කුලියද, 1993 වර්ෂයේදී ත්‍රිකුණාමලය ද ලෙස ධීවර පුහුණු මධ්‍යස්ථාන 06 ක ක්‍රමික විකාශයකින් පසු 1999 වර්ෂයේදී ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත මඟින් 1999 දෙසැම්බර් මස 20 වැනි දින සිට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය නමින් ස්ථාපිත වී 2006 වර්ෂයේදී ගාල්ල සහ 2008 වසරේදී කළුතර උතුර ප්‍රදේශයේ නව ධීවර හා නාවික ඉංජිනේරු විද්‍යාල 02 ක් ව්‍යාප්ත විය. මෙලෙස, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් දසත විහිදුන ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක වෘත්තීය පුහුණු අංශය වර්ධනය වී ඇති අතර පීඨ 02 කින් සමන්විත වූ උසස් අධ්‍යයන අංශය ද එකතුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකික ධීවර ක්ෂේත්‍රයේ පුහුණු මානව සම්පත වර්ධනය කිරීමේ කාර්යභාරයේ පෙර ගමන්කරුවකු බවට පත් වී ඇත.

2001 වර්ෂයේදී උපාධි පාඨමාලා ආරම්භ වීමත් සමඟ 2003 වසරේදී ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී පාඨමාලාවද, නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සහ යාත්‍රා ගොඩනැඟීම් සහ නාවික නිර්මාණ ශිල්පී විද්‍යාවේදී පාඨමාලාවද රජයේ පිළිගත් උපාධි පාඨමාලා වශයෙන් ගැසට් කර ප්‍රකාශයට පත් කරන ලදී.

2014 වසරේදී නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද, 2015 වසරේදී වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුල වාණිජ හා කලා ඇතුළු සියලු විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් වන සිසු දරු දරුදැරියන්ට වැඩි උපාධි අධ්‍යයන අවස්ථා ලබා දීමේ දොරටු විවර කර දෙමිනි.

සාගර විද්‍යාවිද්‍යාවේදී උපාධි පාඨමාලාව 2019 වර්ෂයේදීද, ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලාව 2020 වර්ෂයේදීද, විශ්වවිද්‍යාලයීය උපාධි විෂය ධාරාවන් සඳහා එක්වූ නවතම පාඨමාලාවන් විය.

1999 වසරේදී පිහිට වූ ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත අහෝසි කරමින් 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත සම්මත වූ අතර, 2015 වසරේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපනය වීමෙන් ශ්‍රී ලාංකික දුදරුවන්ට උසස් අධ්‍යයන වරම් සඳහා වැඩි ඉඩකඩක් විවෘත විය.

දැක්ම

සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.

මෙහෙවර

කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීම.

විශ්වවිද්‍යාලයේ අරමුණු

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

01. ධීවර ,සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

02. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම.

03. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

04. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.


05. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

06. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම.

07. ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීනත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

05. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය හා සේවා දායකත්වය.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය උසස් අධ්‍යයන සහ වෘත්තීය පුහුණු ලෙස අංශ දෙකකින් ක්‍රියාත්මක වේ. පීඨ දෙකකින් සමන්විත උසස් අධ්‍යයන අංශයත්, මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලියේ නියමු මධ්‍යස්ථාන වශයෙන් ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක් ද වශයෙන් ඇතුළත් වෘත්තීය පුහුණු අංශයත් ශ්‍රී ලාංකික සංවර්ධන කාර්යභාරයට ලබා දෙන දායකත්වය පහත පරිදි වේ.



සේවා දායකත්වය.

ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි දී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් කණ්ඩායම් ආයතනයේ ඉලක්ක ගත කණ්ඩායම් ලෙස සලකා සේවා දායකත්වය සපයනු ලැබේ.


- ධීවර,සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අලුතින් අවතීර්ණ වන්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අවතීර්ණ වීමට අපේක්ෂා කරන්නන්
- ධීවර, සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ විෂයයන් ඉගැන්වීම කරන ආචාර්ය මණ්ඩලය සහ උපදේශකවරු

06. උසස් අධ්‍යයන අංශය.

සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය යටතේ 2020 වසර තුලදී උපාධි පාඨමාලා 06 ක්, ප්‍රථම වරට තාක්ෂණවේදී උපාධි පාඨමාලාවක සමාරම්භය ද ඇතුළත්ව ක්‍රියාත්මක විය. තංගල්ල ධීවර හා සමුද්‍ර විද්‍යා පීඨය යටතේ ධීවර හා සමුද්‍රීය විද්‍යා, සාගර විද්‍යා සහ ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලා පැවැත්වූ අතර, මට්ටක්කුලිය පිහිටි ඉංජිනේරු හා කළමනාකරණ පීඨය යටතේ නාවික ඉංජිනේරු, නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමණාකරණ, වෙරළ සහ නාවික සම්පත් කළමණාකරණ උපාධි පාඨමාලා ක්‍රියාත්මක විය. 2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය විසින් පවත්වන උපාධි පාඨමාලාවන් ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා Z අගය (Z-Score) මත පදනම්ව ද අනෙකුත් උපාධි පාඨමාලා සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල මත ද ශිෂ්‍ය බඳවා ගැනීම් වසර තුළදී සිදු කර ඇත.

වගුව අංක 1- වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය

	විද්‍යාවේදී උපාධි වැඩසටහන්	ශිෂ්‍ය සංඛ්‍යාව								
		2012/2013	**2013/2014**	**2014/2015**	**2015/2016**	**2016/2017**	**2017/2018**	**2018/2019**	**2019/2020**	**2020/2021**
1.	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	42	40	27	26	35	40	37	47	50
2.	නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	-	40	30	30	39	47	53	53	73
3.	වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධිය	-	-	17	12	14	40	45	55	65
4.	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය	27	27	12	43	40	41	41	49	59
5.	ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය	-	-	-	-	-	-	-	-	40



වගුව අංක 2 - උපාධිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව

	උපාධි පාඨමාලා	ශිෂ්‍ය සංඛ්‍යාව				
		2016/2017	2017/2018	2018/2019	2019/2020	2020/2021
1.	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	26	31	36	36	50
2.	නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	34	42	52	53	73
3.	වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධිය	12	36	42	50	65
4.	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය	38	21	33	42	59
5.	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය (විශේෂවේදී)	05	-	-	-	-
6.	සාගර විද්‍යා උපාධිය (විද්‍යාවේදී -අවු. 4)	-	-	-	26	23
7.	ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය	-	-	-	-	40

සිසුන් ආයතනික පුහුණුව සඳහා යොමු කිරීම.

උපාධි පාඨමාලාව හදාරණ සිසුන් පාඨමාලාව අවසානයේදී ආයතනික පුහුණුව සඳහා යොමු කරන අතර, එමගින් සිසුන් හට ක්ෂේත්‍රය හා සබැඳි විවිධ ආයතනයන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට හැකියාව ලැබේ. ආයතනික පුහුණුව සඳහා යොමුකරන ආයතන පහත දක්වා ඇත.

රාජ්‍ය ආයතන	පෞද්ගලික ආයතන
• ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය • නාරා ආයතනය • සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය • ශ්‍රී ලංකා පරමාණු බලශක්ති අධිකාරිය • ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව • මධ්‍යම පරිසර අධිකාරිය • ශ්‍රී ලංකා රේගුව • ශ්‍රී ලංකා වරාය අධිකාරිය • ආරක්ෂක අමාත්‍යාංශය • ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය • ධීවර දෙපාර්තමේන්තුව • පශු වෛද්‍ය පීඨය	• රයිගම් මාර්කටින් • ඇල්ෆෙක්ස් මැරීන් ආයතනය • සිලෝන් සීවීඩ් පුද්ගලික සමාගම • ලංකා ඇක්වා ප්ලාන්ට් සමාගම • පී එන් ප්‍රනාන්දු සහ සමාගම • සදර්න් සීෆුඩ් ආයතනය • මාස් හෝල්ඩින්ස් • රුවනි ඇක්වා ප්ලාන්ට් • මාස්ටර් ඩයිවර්ස් • බ්ලූ රිසෝස් ට්‍රස්ට් • ඕෂන්පික් පුද්ගලික ආයතනය

වගුව අංක 4 - ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ආචාර්‍ය්‍ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එම්. එෆ්. එම්. ෆයිරෝස් මහතා	B.Sc.,M.Phil,(Ruhuna,SriLanka), PhD (Shizuoka, Japan)
02.	ආචාර්ය එම්. පී. කුමාර මහතා	B.Sc.(Hons), (Ruhuna,SL), Ph.D (Edinburgh Napier,UK)
කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී.එල් වික්‍රමසිංහ මිය	B.Sc.(Hons)(Ruhuna, SL), M.Sc. (Vrije, Belgium) Ph.D.(ICAR-CIFE, Mumbai,India)
02.	ආචාර්ය එරන්දි පතිරණ මිය	B.Sc (Peradeniya, SL), M.Sc (Osaka, Japan), DCSD (NIBM,SL), PhD (Sydney)
03.	ටී.ඩබ්.එස්. වර්ණසුරිය මහතා	**B**.Sc.(Hons), (Ruhuna,SL)), M.Sc.(Colombo, SL)
04.	එන්. පී. ජී. පුෂ්පිත මහතා	B.Sc.MPhil and PhD (Ruhuna,SL)
05.	එස්. එන්. දුෂානි මිය	B.Sc.(Hons), (Ruhuna,SL)), M.Sc.(Tromso, Norway)
06.	බී.ඒ. එන්. ඉන්දිකා මිය	B.Sc.(Hons), (Ruhuna,SL), M.Sc. in Fisheries and Aquactic Resources Management (Jayawardhanapura, SL)
07.	ඩබ්. ඒ. ඒ. යූ. කුමාර මහතා	B.Sc.(Hons), (Ruhuna,SL), M.Sc. (James Cook, Australia)
08.	එම්. අයි. යූ. මානික්කආරච්චි මිය	B.Sc.(Hons), (Ruhuna,SL), Master of Science in Maritime Affairs (Marine Environment and Ocean Management), (W M U. Sweden)
09.	ඒම්.ටී.ජී. රත්නසූරිය මහතා	B.Sc.(Hons), (Ruhuna,SL), M.Sc (Pahyoug National University ,Korea)
10.	ඩබ්.ඒ. ශිරාන් චාමික මහතා	B.Sc (Hons), (Ocean University, SL)

වගුව අංක 5 - ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨයේ ආචාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එච්.බී.ජයසිරි මහතා	B.Sc. in Biological Science (Ruhuna,SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (CIFE, Mumbai, India
02.	ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	B.Sc. in Physical Science (Peradeniya,SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (Peradeniya,SL)
03.	එස්.පී.යූ. ජිනදාස මහතා	B.Sc. in Special in Geology (Peradeniya,SL), (Mphil) Applied Geophysics (Open University Sri Lanka)
කථිකාචාර්යවරුන්		
01.	එම්.සී.එල් .සොයිසා මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management (Kelaniya, SL)
02.	ඊ.ඒ.කේ.කේ. අමරසේකර මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management (Kelaniya, SL)
03.	එච්.ඒ.පී.එස්.ජයපාල මහත්මිය	B.Sc. in Degree (Open SL), M.Sc. in Fisheries & Aquatic Resources Management (Sri Jayawardhanapura,SL)
04.	පී.ඒ.එස්.ඒ. රත්න ශ්‍රී මිය	B.Sc. (Special) in Aquatic Science (Sri Jayawardhanapura, SL), M.Sc. in Environmental Science (Open University, SL)
05.	ඒ. අරුල්නායගම් මිය	B.Sc. (Special) in Environmental Sciences Vauniya Campus of the (University of Jaffna, SL), M.Sc. in Environmental Science (Peradeniya, SL)
06.	ඩී.එස්.මානගේ මිය	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Business Administration
07.	එච්. ඩී.එම්.එම්.පුස්සැල්ල මිය	B.Sc. (Hons) in Business Administration (Peradeniya,SL)
08.	ටී.පී.ජී.එන් අසන්ත ද අල්විස් මහතා	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Management & Finance (Reading)
09.	එම්.ජේ.එම්.ඒ. රසුල් මහතා	B.Sc. in (Ruhuna,SL), MSc. (Agder,Norway)
10.	පී.ඩී.ඩී. හර්ෂප්‍රිය මහතා	B.Sc. in Ocean University of Sri Lanka
11.	ඒ.එච්.එස්.අයි. වීරකෝන් මහතා	B.Sc. in Ocean University of Sri Lanka
12.	ජී.ඒ.එස්. චතුරි ගනේපොල මිය	Master of Business Administration,(Colombo,SL)Bachelor of Business Administration (Hons) in Business Economics,(Colombo,SL) Charted Institute of Management Accountants (CIMA)
13.	ඩබ්.පී.ඩබ්.අන්ජලිකා මිය	B.A. in Economics (Special) (Sabaragamuwa, SL)
14.	ඒච්.ඒ.ඩී. නිසඟ නුවන්ත මහතා	B.Sc. in Marine Engineering, Ocean University of Sri Lanka
15.	සඳුන් කෞශල්‍ය විමලරත්න මහතා	B.Sc.in Marine Engineering, Ocean University of Sri Lanka

ප්‍රගතිය.

❖ පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව ශිෂ්‍ය ලියාපදිංචිය ඉතා ඉහල මට්ටමක පැවතුණ අතර, ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලාව හඳුන්වා දීම සිදු විය. ප්‍රථම වරට ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තාක්ෂණවේදී උපාධි පාඨමාලාවක් සඳහා ආරම්භය ලබාදුන් වසර වේ.

❖ සිසුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය ලෙස මෙතෙක් පැවැති අ.පො.ස උසස් පෙළ විභාගය ප්‍රතිඵල මත (Z-Score) අගයන් සඳහා පමණක් බඳවා ගැනීම වෙනුවට වෘත්තීය පුහුණු සුදුසුකම් සපුරන ලද සිසුන් හටද උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වීමට අවස්ථාව සැළසීම.මෙමඟින්, වෘත්තීය පුහුණු අංශයේ NVQ 05 මට්ටම සමත් සිසුන් හටද වැඩිදුර අධ්‍යාපනය සඳහා උපාධි පාඨමාලා වලට ඇතුලත් වීමේ අවස්ථාව හිමිවිය.

❖ උපාධි පාඨමාලා සඳහා ආයතනික හා විෂය සමාලෝචනය කිරීමේ කටයුතු ඇරඹීම.

❖ නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨය හා ධීවර හා සමුද්‍ර විද්‍යා පීඨය සඳහා ස්ථීර පීඨාධිපතිවරුන් පත්කර පීඨ මණ්ඩල මඟින් උපාධි පාඨමාලා කළමනාකරණය කිරීම සහ උපාධි පාඨමාලා සඳහා අංශාධිපතිවරුන් පත්කිරීම.

❖ විශ්වවිද්‍යාලයීය දෙවන පර්යේෂණ සමුළුව (Second Research Symposium) 2020.11.17 දින පැවැත්වීම.

❖ නව උපාධි පාඨමාලවක් (B.Tech in Supply Chain Management) සඳහා විෂය මාලා සැකසීමේ කටයුතු ඇරඹීම.

❖ අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන විශ්වවිද්‍යාලයීය සිසුන් හට හිමි අනුග්‍රාහක දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ සිසුන් හටද ලබා ගැනීම සඳහා කටයුතු සැළසීම.

❖ නාවික ඉංජිනේරු උපාධි පාඨමාලා හදාරන සිසුන් සඳහා CDC සහතිකය ලබා ගැනීමට අවශ්‍ය වන පාඨමාලා සංශෝධනයට සුදුසුකම්ලත් නාවික ඉංජිනේරුවරයෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම.

❖ පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව සහ ප්‍රතිපත්ති සහ ක්‍රමවේද කමිටු ස්ථාපිත කිරීම.

❖ පශ්චාත් උපාධි ප්‍රදානයන් වන MSc සහ MPhil, PhD වැඩසටහන් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් පර්යේෂණ සිදුකිරීම ආරම්භ කිරීම සඳහා පශ්චාත් උපාධි ප්‍රදාන අතුරු සම්මත නිති සැකසීම.

❖ විභාග කටයුතු, ශිෂ්‍ය නේවාසික පහසුකම් හා විනය, උපාධි පාඨමාලා සඳහා අධ්‍යයන පරිපාටි, ශිෂ්‍ය වෘත්තීය සංගම්, උපාධි පාඨමාලා සඳහා පශ්චාත් උපාධි ප්‍රදාන පිරිනැමීම යන අංශයන් සඳහා ‘‘අතුරු සම්මත නිති’’ සම්පාදනය කිරීම.

❖ 2020 වසර කොවිඩ් 19 වසංගත තත්වය තුල විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන අධ්‍යයන කටයුතු අන්තර්ජාලය භාවිතා කර මාර්ගගත ක්‍රමය භාවිතයෙන් පවත්වන්නට කටයුතු කිරීම.

❖ තවද, නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා නාවික ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබාගෙන එම පාඨමාලාව සඳහා Bridging course ගොඩනැඟීම සිදුවිය.

❖ එක්සත් රාජධානියේ සැපයුම් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය මඟින් නාවික ප්‍රවාහනය සහ භාණ්ඩ හා සේවා කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලා පිළිගැනීම.

❖ උසස් අධ්‍යයන අංශයේ නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා ලබාගෙන තිබූ 9001-2015 තත්ත්ව සහතික යථාවත්ව පවත්වා ගෙන යාම.

❖ උපාධි පාඨමාලා ප්‍රායෝගික කටයුතු සඳහා අවශ්‍ය කරන විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම.

❖ E - Learning Platform ස්ථාපිත කර කාර්ය මණ්ඩලය ඒ සඳහා පුහුණු කිරීම.

❖ E - Learning Platform (Moodle) Managing Package & Computer Infrastructure සඳහා ආධාර "AHEAD" ව්‍යාපෘතිය මඟින් ලබා ගැනීම.

❖ සාගර විශ්වවිද්‍යාලයේ ප්‍රථම පුවත්පත් සඟරාව එළිදැක්වීමට කටයුතු කිරීම.

ජාත්‍යන්තර සහයෝගීතාවයන්.

01. **KOICA** ව්‍යාපෘතිය යටතේ සාගර විශ්වවිද්‍යාලයට අවශ්‍ය අංග සම්පූර්ණ ගොඩනැඟිලි සහ අදාළ පහසුකම් සැළසීම සඳහා වන ශාක්‍යතා වාර්තාව පිළියෙල කිරීම.


02. ශ්‍රී ලංකා ඇමරිකා ලොස් ඇන්ජලීස් ජායාරූප සංගමය මඟින් "සමුද්‍රීය පරිසර ආශ්චර්ය" තේමාව යටතේ ශ්‍රී ලංකා වෙරළ හා සාගර පරිසරය වර්තමාන තත්ත්වය පිළිබඳ මාර්ගගත ක්‍රමයට දේශන (On Line) ලබා දීම.

03. ගෝලීය කොරල්පර ජාලය සඳහා අවශ්‍ය වන කොරල් පර පිළිබඳ දකුණු ආසියානු දත්ත විශ්ලේෂණ වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය මාලදිවයිනට ලබා දීම.


07.වෘත්තීය පුහුණු අංශය

2020 වර්ෂය තුලදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශ ප්‍රාදේශීය විද්‍යාල (08) පාඨමාලා ප්‍රගතිය

ක්ෂේත්‍රය	නිපුණතා මට්ටම (NVQ/ NON NVQ)	සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව
ධීවර හා ජලජීවී වගාව	NVQ	300
	Non	404
තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන	NVQ	52
	Non	0
සමුද්‍රීය හා නාවික විද්‍යාව	NVQ	300
	Non	39
වෙනත් (ජංගම)	NVQ	0
	Non	141



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය මධ්‍යස්ථාන



2020 වර්ෂයේදී ලබාගත් ජයග්‍රහණ

❖ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 136ක වියදමින් මහල් 04 ක ගොඩනැගිල්ලක් 2017 වසරේ ඉදිකිරීම ආරම්භ කරන ලද අතර 2020 වර්ෂය වනවිට ඉදිකිරිම් නිම කර පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරන ලදි.





❖ ජාතික හා පළාත් මට්ටමින් මධ්‍යම මට්ටමේ රජයේ ආයතනයක "ජාතික වෘත්තීය පුහුණු විශිෂ්ටතා සම්මානය - 2020" ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ තංගල්ල ප්‍රාදේශීය විද්‍යාලයට හිමි විය.



❖ ප්‍රාදේශිය විද්‍යාල මඟින් පාඨමාලා අවසානයේ රැකියාගත පුහුණු ආයතන සඳහා සිසුන් අනුයුක්ත කිරීම.

❖ NVQ 5 මට්ටමේ සිට NVQ 6 සහ NVQ 7 යන මට්ටම් දක්වා පාඨමාලා සංවර්ධනය කිරීම.

❖ NVQ 7 මට්ටමේ ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීමේ තරඟ විභාගය පවත්වා සිසුන් ඇතුලත් කර ගැනීමට කටයුතු සිදුකිරීම.

❖ මධ්‍යස්ථාන සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති (Quality Management System -QMS) හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම තුළ විධිමත් කළමනාකරණයකින් යුතු ඵලදායි සේවාවක් අභ්‍යාසලාභීන්ට ලබා දීමට ක්‍රියා කිරීම.

❖ වෘත්තීය පුහුණු පාඨමාලා විෂය ධාරා මාර්ගගත ක්‍රමය (Online) යටතේ ක්‍රියාත්මක කිරීම.

❖ වෘත්තීය පුහුණු අංශයේ මට්ටක්කුලිය, තංගල්ල ප්‍රාදේශීය විද්‍යාලයන් සඳහා ලබාගෙන තිබූ 9001-2015 තත්ත්ව සහතික යථාවත්ව පවත්වා ගෙන යාම.

❖ දිවයින පුරා සිටින බහුදින ධීවර යාත්‍රා නියමුවන් 346ක් සඳහා ධීවර යාත්‍රා නියමු පුහුණුව ලබා දීම.

<u>ශිෂ්‍ය සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග.</u>

- ධීවර ප්‍රජාව පාඨමාලා පිළිබඳ දැනුවත් කර ඔවුන්ගේ දරුවන්ට පාඨමාලා හැදෑරීමට අවකාශ සලසා දීම.

- දිවයින පුරා විසිර සිටින සේවා අපේක්ෂිතයින් දැනුවත් කිරීම සඳහා පුවත්පත්,රූපවාහිනී සහ විද්‍යුත් මාධ්‍යයන් ඔස්සේ පාඨමාලා පිළිබඳ විස්තරාත්මක තොරතුරු පල කිරීම මඟින් පාඨමාලා සඳහා ශිෂ්‍ය බඳවා ගැනීමේ වර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කිරීම.

- ප්‍රාදේශීය මධ්‍යස්ථාන විසින් තම බල ප්‍රදේශයන්ට අයත් රාජ්‍ය පාසල් වල සිසුන්, ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ ප්‍රදර්ශන වෙනුවෙන් ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරීම මඟින් ජනතාව දැනුවත් කිරීම.

2020 වසර තුළදී විශ්වවිද්‍යාල වෘත්තීය පුහුණු අංශයේ ප්‍රගතිය සළකා බැලීමේදී කෝවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය ශ්‍රී ලංකාවට ද කරන ලද බලපෑම හේතුවෙන් ආරම්භ කරන ලද පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන්ගේ අධ්‍යයන කටයුතු අවසන් කිරීමට නොහැකි වූ අතර සමස්ථ වාර්ෂික පුහුණු ඉලක්ක සපුරා ගැනීමට ද නොහැකි තත්ත්වයක් උද්ගත විය.

8. පාලන අංශය.

<u>පාලන අංශය යටතේ ක්‍රියාත්මක උප අංශයන්ගේ ප්‍රගතිය:</u>

➢ **<u>මානව සම්පත් අංශය</u>**

විශ්වවිද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ හා ඵලදායී කාර්යශූර කාර්ය මණ්ඩලයක් බිහි කිරීමේ අරමුණින්, අවශ්‍ය පුහුණු පාඨමාලාවන් සඳහා යොමු කිරීම සිදු කෙරෙන අතරම, මනා විනය පද්ධතියකින් ද යුක්තව සේවක මණ්ඩල කළමනාකරණය සිදු කරයි.

<u>වසර තුළ ක්‍රියාකාරිත්වය</u>

- ❖ අධ්‍යයන කාර්ය මණ්ඩලය (කථිකාචාර්ය, ප්‍රදර්ශක) බඳවා ගැනීම.
- ❖ වසරක කාල සීමාවකට කාර්යය පැවරුම් පදනම මත නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා බඳවා ගැනීම.
- ❖ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වූ බඳවා ගැනීම් පරිපාටිය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. (කළමනාකරණ සහකාර, රියදුරු, රසායනාගාර සහායක, කාර්යාල කාර්ය සහායක හා කම්කරු)
- ❖ අනුමත සේවක සංඛ්‍යාව අමතරව, නව තනතුරු ඇති කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ ශ්‍රේණිගත කිරීම් වලට අදාළ කටයුතු කිරීම.
- ❖ සේවක අන්තර්ග්‍රහණයේදී ඇතැම් සේවකයන්ට සිදුව ඇති අසාධාරණයන් පිළිබඳව සොයා බලා සාධාරණය ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- ❖ පුහුණුවීම් (දේශීය) සඳහා සෑම ස්ථරයකම කාර්ය මණ්ඩල යොමු කොට අදාළ ක්ෂේත්‍රවල පුහුණුව ලබා දීම, වෘත්තීය පුහුණු අංශයේ අධ්‍යයන කාර්යය මණ්ඩල 2 ක් සඳහා කොරියානු පශ්චාත් උපාධි පාඨමාලා අවස්ථා සළසා දීමද, උසස් අධ්‍යයන හා වෘත්තීය පුහුණු කාර්ය මණ්ඩල සඳහා කාර්මික පුහුණු අවස්ථා ලබා දීමට ද කටයුතු කිරීම.

ඒ අනුව, 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

(අ) කාර්ය මණ්ඩල විස්තර

කාර්ය මණ්ඩලය	වැටුප් ක්ෂේතය	අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව	පවතින කාර්ය මණ්ඩලය			සත්‍ය කාර්ය මණ්ඩලය	ස්ථීර කාර්ය මණ්ඩල පුරප්පාඩු
			ස්ථීර	තාවකාලික	කොන්ත්‍රාත්		
අධ්‍යයන උපකුලපති පීඨාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/කථිකාචාර්ය/කථිකාචාර්ය පරිවාස	U AC 5 U AC 3	01 02 31	01 02 28	00 00 00	00 00 02	01 02 30	00 00 01
පුස්තකාල සහකාර පුස්තකාලාධිපති	U AC 3	03	00	00	00	00	03
පරිපාලන හා මූල්‍ය ලේඛකාධිකාරී	U EX 3	01	01	00	00	01	00

අධ්‍යක්ෂ (මූල්‍ය)	U EX 3	01	01	00	00	01	00
නියෝජ්‍ය ලේඛකාධිකාරී	U EX 2	01	00	00	00	00	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය)	U EX 2	01	00	01	00	01	00
අධ්‍යක්ෂ (ප්‍රහුණු)	HM 1-1	01	01	00	00	01	00
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)	U EX 2	01	00	00	00	00	01
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	U EX 2	01	01	00	00	01	00
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	U EX 2	02	01	00	00	01	01
අනෙකුත් විධායක							
ඉංජිනේරු (වැඩහල්)	U EX 1	01	01	00	00	01	00
නාවික ඉංජිනේරු	U EX 1	01	00	00	00	00	01
ඉංජිනේරු (සිවිල්)	U EX 1	01	00	00	00	00	01
සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)	U EX 1	01	01	00	00	01	00
සහකාර ලේඛකාධිකාරී	U EX 1	02	03	00	00	03	00
සහකාර අභ්‍යන්තර විගණක	U EX 1	01	01	00	00	01	00
නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ	MM 1-1	10	08	00	00	08	02
අධ්‍යයන සහායක							
විද්‍යාල කථිකාචාර්ය	U EX 1	08	07	00	00	07	00
උපදේශක	U AS 1/ U MN 2-2	(Person to hold basis)					
උප නේවාසිකාගාර පාලක	U MN 3	01	00	00	00	00	01
	AR 1	01	00	00	00	00	01
විද්‍යාල උපදේශක	Fixes/U	41	11	00	23	34	07
ප්‍රදර්ශක	MN 2-2	07	01	00	03	04	03
සහකාර විද්‍යාල උපදේශක	U MN 1	20	03	00	00	03	17
උපදේශක (ඉංග්‍රීසි)		08	00	00	00	00	08
උපදේශක (තාවකාලික)	AR 1 Fixed	05	00	00	00	00	05
තාක්ෂණ නිලධාරී	U MT 1	06	02	00	00	02	04
යාත්‍රාපති	U MT 1	03	02	00	00	02	01
එන්ජින් කාමර කර්මාන්ත ශිල්පී	U MT 1	03	02	00	00	02	01
යාත්‍රා ක්‍රියාකරු	U MT 1	03	01	00	00	01	02
තාක්ෂණ නිලධාරී (රසායන)	U MT 1	01	00	00	00	00	01
තොරතුරු තාක්ෂණ සහායක	U MT 1	02	00	00	00	00	02
තාක්ෂණ සහායක	MA 2-2	08	00	00	00	00	08
නේවාසිකාගර පාලක	U MN 3	01	00	00	00	00	01

කළමනාකරණ සහකාර	U MN 1	51 (27 person to hold basis)	49	00	00	49	0
විගණන සහායක		02	00	00	00	00	02
පොත් තබන්නා		01	00	00	00	00	01
සරප්		01	00	00	00	00	01
පුස්තකාල තොරතුරු සහායක		03	00	00	00	00	03
ප්‍රාථමික							
රියදුරු	U PL 3	15	18	00	00	18	00
නැවි	U PL 3	22	08	00	00	08	14
බෝසන්	U PL 3	03	01	00	00	01	02
විදුලි කාර්මික ශිල්පී	U PL 3	02	00	00	00	00	02
ජලනල කාර්මික ශිල්පී	U PL 3	02	00	00	00	00	02
යන්ත්‍රකරු	U PL 3	02	00	00	00	00	02
රසායනාගාර සහායක	U PL 2	02	04	00	00	04	00
කාර්යාල කාර්ය සහායක	U PL 1	19	26	00	00	26	00
පුස්තකාල සහායක	U PL 1	02	00	00	00	00	02
වැඩහල් සහායක	U PL 2	02	00	00	00	00	02
කම්කරු	U PL 1	27	19 (Person to hold basis)	00	00	19	00

(ආ). අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

පීඨය/ප්‍රාදේශීය මධ්‍යස්ථානය	**සේවක සංඛ්‍යාව**				
	ජ්‍යෙෂ්ඨ	**තෘතීය**	**ද්විතීය**	**ප්‍රාථමික**	**කොන්ත්‍රාත්**
ප්‍රධාන කාර්යාලය	07	04	17	27	02
උසස් අධ්‍යයන අංශය - ප්‍රධාන කාර්යාලය	01	01	06	03	05
තංගල්ල මත්ස්‍ය හා සාගර විද්‍යා පීඨය			10	03	00
තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය		04	10	13	04
මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය		02	01	02	07
පානදුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය		01	02	01	06
මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය		01	04	04	04
ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය		02	09	07	03
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය මධ්‍යස්ථානය		01	02	02	00
මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය		02	05	08	00
යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය		01	02	03	02

(ඇ) පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වය

පාඨමාලා	වැඩසටහන	දේශීය	විදේශීය	සහභාගී වූ සංඛ්‍යාව
පශ්චාත් උපාධි පාඨමාලා			x	02
පශ්චාත් උපාධි ඩිප්ලෝමා				
උපාධි වැඩසටහන්				
ඩිප්ලෝමා වැඩසටහන්				
සහතික පත්‍ර වැඩසටහන්		x		18
වෙනත් (සම්මන්ත්‍රණ/වැඩමුළු)		x		07
එකතුව				**27**

➢ **ප්‍රවාහන අංශය**

1. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සතු වාහන 32 ක ඇනිය නඩත්තු කරමින් ආයතනික රාජකාරි කටයුතු වෙනුවෙන් යෙදවීම සහ විශ්වවිද්‍යාලය සතු වාහන 08 ක් අපහරණ තත්ත්වයේ පවතින බව හඳුනා ගැනීම.

2. තංගල්ල විද්‍යාලය වෙත අනුයුක්ත කර තිබූ වාහන 02 ක අපහරණ කටයුතු අවසන් කිරීම.

මෝටර් රථ වර්ගය	වාහන අංකය
ඉසුසු ජර්නි බස් රථය	29-5407
බජාජ් යතුරු පැදිය	146-6027

3. විශ්වවිද්‍යාලය සතු අපහරණය සඳහා හඳුනාගන්නා ලද පහත සඳහන් වාහන 02 සම්බන්ධව අපහරණ කටයුතු ආරම්භ කිරීම.

මෝටර් රථ වර්ගය	වාහන අංකය
මිට්සුබිෂි ජීප් රථය	64-5796
මිට්සුබිෂි ලොරි රථය	42-1677

4. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වෙත ලබාදෙන ලද වාහන 06 හි පැවැති දෝෂ සහගත තත්ත්වයන් නිවැරදි කර ධාවන තත්වයට සුදුසු ලෙස සකසා විශ්වවිද්‍යාලයේ රාජකාරී කටයුතු සඳහා යෙදවීම.

09.අභ්‍යන්තර විගණන අංශය.

අභ්‍යන්තර විගණන අංශයේ දැක්ම

මූල්‍ය කටයුතු, පාලන කටයුතු හා සංවර්ධන ක්‍රියාකාරකම් හි පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳ අඛණ්ඩ හා ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යමින්, එකී ක්‍රියාවලියට සම්බන්ධ වී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් නිර්දේශ කිරීම මඟින් යහපාලනය අර්ථවත් කිරීම සඳහා දායකවීම.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්

- ❖ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ක්‍රියාකාරිත්වයන් සාර්ථකදැයි සෙවීම.
- ❖ නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- ❖ කාර්ය මණ්ඩලයේ පැවරුම් කාර්යන් ඉටුවේ දැයි සෙවීම.
- ❖ වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ඇත්තේ දැයි සෙවීම.
- ❖ නීතිරීති ක්‍රියාපරිපාටි අනුගමනය කරන්නේ දැයි සෙවීම.
- ❖ නාස්තිය, දූෂණය, අනවශ්‍ය වියදම් වැළැක්වීමේ පාලන ක්‍රම පවතින්නේද යන්න සෙවීම.
- ❖ වත්කම් අරපිරිමැසුම් දායකව පරිහරණය කරන්නේ ද යන්න විමසීම.
- ❖ විශේෂ විමර්ශන පැවැත්වීම.
- ❖ කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් මෙහෙයුම් කටයුතු පිරික්සීම.


දිවයිනේ අනෙකුත් විද්‍යාල සියල්ල ආවරණය වන පරිදි විගණන හා විමර්ශන රාජකාරී කටයුතු සිදු කෙරෙමින්, ආයතනයේ මූල්‍ය හා පරිපාලනය නිවැරදි මාවතක් කරා මෙහෙයවීම ද අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කෙරේ.

විගණන අංශයේ ප්‍රගතිය

අභ්‍යන්තර විගණන වැඩ සැලැස්ම තුළ ක්‍රියාත්මක කිරීම.

- ➢ අභ්‍යන්තර විගණන විමසුම් 13 ක් සම්පාදනය කිරීම හා එහි ප්‍රගති කටයුතු සම්බන්ධීකරණය කිරීම.

අභ්‍යන්තර විගණන විමසුම්



10. අවසන් ගිණුම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - 2020 දෙසැම්බර් 31 දිනට

	සටහන	2020/12/31 දිනට		2019/12/31 දිනට	
		රු		රු	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ	(1)	681,792,712		648,762,979	
අස්පෘශ්‍ය වත්කම්		1,058,500.00	682,851,212		648,762,979
ස්ථාවර තැන්පතු		5,065,976		4,593,819	
ජංගම වත්කම්			5,065,976		4,593,819
කාර්ය මණ්ඩල ණය	(2)	15,195,354		13,167,510	
භාණ්ඩ ලේඛනය	(3)	1,747,782		1,422,223	
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ	(4)	60,926,113		32,654,273	
අවිනිශ්චිත ගිණුම		85,433		85,433	
මුදල් හා මුදල් සමාන දේ	(5)	15,579,135	93,533,817	15,589,028	62,918,466
මුළු වත්කම්			781,451,005		716,275,264
නිමිකම් සහ වගකීම්					
ප්‍රාග්ධනය හා සංචිත	(6)	5,584,122		3,576,819	
සමුච්චිත අරමුදල	(7)	802,744,130		822,051,587	
සමුච්චිත අරමුදල SSDP	(8)	300,060,865		239,045,854	
සමුච්චිත අතිරික්තය / (හිඟය)	(9)	(518,985,846)		(514,416,548)	
	(10)		589,403,271		550,257,712
ජංගම නොවන වගකීම්					
විලම්බිත ආදායම්					
පාරිශ්‍රමිකය සඳහා ප්‍රතිපාදන		69,939,906	69,939,906	63,379,169	63,379,169
උපචිත වියදම්	(11)	101,359,285		83,644,548	
ගෙවිය යුතු දේ	(12)	20,748,541	122,107,825	18,993,833	102,638,381.0
මුළු වගකීම්			**781,451,005**		**716,275,264**

M. HARAWITA
DIRECTOR FINANCE
Ocean University Of Sri Lanka
Crow Island, Mattakkuliya,
Colombo 15.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන	2020	2019
		රු	රු.
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රදාන		377,767,500	325,340,000
වෙනත් ආදායම්	**(13)**	11,503,957	4,617,034
SSDP- පුනරාවර්තන ප්‍රදාන		6,365,418	4,177,597
මෙහෙයුම් ආදායම		395,636,874	334,134,631
ක්‍රමක්ෂය කිරීමෙන් විලම්බිත ආදායම		66,254,498	71,119,936
		461,891,372	405,254,567
මෙහෙයුම් වියදම්			
පුද්ගල පඩිනඩි	**(14)**	329,477,470	265,576,275
ගමන් වියදම්	**(15)**	2,053,428	3,136,345
සැපයුම් සහ පරිභෝජන වියදම්	**(16)**	5,249,848	8,607,415
නඩත්තු වියදම්	**(17)**	4,823,133	5,282,355
කොන්ත්‍රාත් සේවා	**(18)**	44,299,344	78,052,964
පුහුණු වියදම්	**(19)**	11,269,887	20,779,816
ක්ෂයවීම	**9**	66,162,157	71,119,936
ක්‍රමක්ෂය වියදම්	**9**	92,340	
වෙනත් වියදම්	**(20)**	2,527,638	4,448,977
මුළු වියදම		465,955,245	457,004,082
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌණතාවය		**(4,063,873)**	**(51,749,516)**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

හිමිකම වෙනස් වීමේ ප්‍රකාශය

සටහන 10	රු.				
	රජයේ දායකත්වය	SSDP ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත	සමුච්චිත අතිරික්තය (හිඟය)	එකතුව
2019/01/01 දිනට ශේෂය	**830,564,132**	**201,422,283**	**-**	**(445,391,295)**	**586,595,120**
වර්ෂය සඳහා ලාභය	-	-	-	(51,749,516)	(51,749,516)
සේවක ප්‍රතිලාභ මත තත්‍ය අලාභය ලැබීම්	-	-	-	-	-
පෙර වර්ෂය සඳහා වූ ගැළපීම්	-	-	-	(17,275,737)	(17,275,737)
ප්‍රාග්ධන හා සංචිත	-	-	3,576,819	-	-
වර්ෂය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන	58,000,000	42,230,962	-	-	100,230,962
විලම්භිත ආදායම	(66,512,545)	(4,607,391)	-	-	(71,119,936)
2019.12.31 දිනට ශේෂය	**822,051,587**	**239,045,854**	**3,576,819**	**(514,449,817)**	**550,224,444**
සේවක ප්‍රතිලාභ මත තත්‍ය අලාභය ලැබීම්	-	-	-	(4,063,873)	(4,063,873)
පෙර වර්ෂය සඳහා වූ ගැළපීම්	-	-	-	-	-
ප්‍රාග්ධන හා සංචිත	-	-	2,007,302	(472,156)	1,535,146
වර්ෂය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන	**42,000,000**	**65,962,050**	-	-	107,962,050
විලම්භිත ආදායම	(61,307,457)	(4,947,039)	-	-	(66,254,496)
2020/12/31 දිනට ශේෂය	**802,744,130**	**300,060,865**	**5,584,121**	**(518,985,846)**	**589,403,271**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

	31/12/2020 රු.	31/12/2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයේ (ඌණතාවය)/ අතිරික්තය	(4,063,873)	(51,749,516)
මූල්‍ය නොවන ගැලපීම්		
ස්ථාවර තැන්පතු පොළි	(458,278)	
පාරිතෝෂික දීමනා	8,455,039	20,223,914
ක්ෂයවීම්/ක්‍රමක්ෂය කිරීම්	66,254,497	71,119,936
පෙර වර්ෂය සඳහා වූ ගැළපීම්	(33,269)	(17,275,737)
ස්ථාවර වත්කම් සම්බන්ධව සිදු කළ ගැලපීම්		23,105,810
ක්ෂයවීම්/ ක්‍රමක්ෂය කිරීම්	(66,254,497)	(71,119,936)
කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමට පෙර මෙහෙයුම් ලාභය	3,899,619	(25,695,529)
(වැඩිවීම්)/ අඩුවීම කාර්ය මණ්ඩලණය	(2,027,844)	
(වැඩිවීම)/ අඩුවීම අවසන් තොගය	(325,559)	377,495
(වැඩිවීම/ අඩුවීම වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	(28,285,719)	44,548,071
(වැඩිවීම/ අඩුවීම වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු මුදල්	18,862,220	33,801,886
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කළ මුදල්	(11,776,902)	78,727,452
පාරිතෝෂික ගෙවීම්	(1,894,302)	(2,176,426)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(1,894,302)**	**(2,176,426)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා එම්		
ස්ථාවර තැන්පතු		(4,593,819)
පොලි ලැබීම්	472,157	
දේපළ පිරියත, සහ උපකරණ අත්පත් කර ගැනීම	(99,735,501)	(150,229,582)
ස්ථාවර තැන්පතු මත ආයෝජනය	(472,157)	
ආයෝජනවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(99,735,501)**	**(154,823,401)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ගලායෑම්		
ස්ථාවර තැන්පතු/සංචිතය	2,007,303	3,576,819
ප්‍රාග්ධන වියදම් සඳහා ලද ප්‍රතිපාදන	42,000,000	58,000,000
ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන	65,962,050	42,230,962
සංචිතයට අරමුදල් මාරුකිරීම	(472,157)	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**109,497,196**	**103,807,781**
මුදල් සහ මුදල් සමානදෑ හි ශුද්ධ වැඩිවීම /(අඩුවීම)	(9,890)	(160,123)
කාලපරිච්ඡේදය ආරම්භයේදී වූ මුදල් සහ මුදල් සමානදෑ	15,589,028	15,749,150
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**15,579,135**	**15,589,027**

සටහන - 1 **දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ**

විස්තරය		2020.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කරගැනීම් (අපහරණය)	වර්ෂය සඳහා ක්ෂය	2020.12.31 දිනට සමුච්චිත ක්ෂය	2020.12.31 දිනට ශේෂය
ඉඩම් හා ඉඩම් සංවර්ධනය	2105	7,939,174.75		793,917.48	4,520,112.32	3,419,062.43
ගොඩනැගිලි පුනරුත්ථාපනය	2001/01	133,643,953.06	1,099,750.00	6,695,347.24	79,883,796.49	54,859,906.57
යටිතල පහසුකම් -මීගමුව ජැටිය	2001/02	379,687.57		18,983.75	379,686.57	1.00
අත්පත්කරගැනීම් -පිරියත හා යන්ත්‍ර	2103	135,828,006.72	8,044,225.00	13,992,940.79	86,571,903.95	57,300,327.77
අත්පත්කරගැනීම්-ගොඩනැගිලි	2104	207,798,862.28	4,346,867.70	10,406,863.52	49,858,456.38	162,287,273.60
බෝට්ටු හා යාත්‍රා පුනරුත්ථාපනය	2005/02	11,832,028.02	2,168,225.31	72,274.18	11,904,301.20	2,095,952.13
ධීවර ආම්පන්න උපකරණ	2107/02	37,273,126.17		3,633,221.02	37,273,125.17	1.00
ගෘහභාණ්ඩ හා සවිකිරීම	2102	107,142,085.98	10,759,060.91	10,758,557.08	55,038,106.14	62,863,040.75
නාමපුවරු	2106/02	1,459,114.80		145,911.48	1,101,075.83	358,038.97
පුස්තකාල පොත්	2107/03	26,191,593.98		2,619,159.38	15,943,004.57	10,248,589.41
වෙනත් වත්කම්	2106/00	8,650,573.72	232,700.00	867,996.20	3,647,192.09	5,236,081.63
වාහන පුනරුත්ථාපනය	2003	24,015,466.23	799,981.73	381,937.15	23,406,068.21	1,409,379.75
පරිගණක	2103/03	33,326,001.33	14,560,560.00	2,411,009.65	33,726,415.33	14,160,146.00
අත්පත්කර ගැනීම් - වාහන	2101	42,373,703.02			42,373,702.02	1.00
විද්‍යාගාර උපකරණ	2107/04	9,728,427.82		223,766.30	9,728,426.82	1.00
කාර්යාල උපකරණ පුනරුත්ථාපනය	2004/00	3,036,695.32	91,443.00	308,112.50	1,532,899.75	1,595,238.57
පිරියත සහ යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය	2002	3,320,497.23	182,142.77	337,221.19	2,505,695.85	996,944.15
අත්පත්කර ගැනීම්-පුහුණු උපකරණ	2107	67,881,876.12	9,654,238.82	6,796,671.57	34,807,207.83	42,728,907.11
පුහුණු උපකරණ පුනරුත්ථාපනය	2005/00	8,849,670.43		884,967.04	4,740,948.39	4,108,722.04
මීගමුව නේවාසිකාගාරය	2104/02	37,436,137.51		1,871,806.88	10,294,937.84	27,141,199.67
සභාපති කාර්යාල ගොඩනැගිල්ල	2104/03	20,185,385.00		1,009,269.25	5,046,346.25	15,139,038.75
යාපනය ගොඩනැගිල්ල	2104/03	27,646,398.62		1,382,319.93	7,717,952.94	19,928,445.68
විශ්වවිද්‍යාල ලෝගු		1,079,250.00		215,850.00	538,950.00	540,300.00
වෙබ් අඩවිය සංවර්ධනය- අස්පෘශ්‍ය වත්කම්			1,058,500.00	92,340.00	92,340.00	966,160.00
කර්මාන්තශාලාව මට්ටක්කුලිය 2104-6		6,681,033.40		334,051.67	334,051.67	6,346,981.73
එකතුව	**(A)**	**963,698,749.08**	**52,997,695.24**	**66,254,495.25**	**522,966,703.61**	**493,729,740.71**

සටහන - 1 **කෙරීගෙනයනවැඩ**

ක්ෂයවීම්		2020.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කරගැනීම් / (අපහරණය)	වර්ෂය සඳහා ක්ෂයවීම්	2020.12.31 දිනට ක්ෂයවීම්	2020.12.31 දිනට ශේෂය
සාගර විශ්වවිද්‍යාල ප්‍රාදේශිය මධ්‍යස්ථානය පානදුර ගොඩනැගිල්ල 2104-5		117,020,790.13	46,475,017.18			163,495,807.31
වැඩ බූස්ස ගොඩනැගිල්ල -2104-6		22,480,313.64	467,894.41			22,948,208.05
JAICA ගොඩනැගිල්ල තංගල්ල 2104-9		1,722,803.24	69,871.58			1,792,674.82
තංගල්ල ශිෂ්‍ය නේවාසිකාගාරය		552,530.96	332,248.04			884,779.00
උප එකතුව	**(B)**	**141,776,437.97**	**47,345,031.21**	**-**		**189,121,469.18**
එකතුව	**(A) + (B)**	**1,105,475,187.05**	**100,342,726.45**	**66,254,495.25**	**522,966,703.61**	**682,851,211.89**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ගිණුම් සඳහා සටහන් 2020 දෙසැම්බර් 31 දිනට

		2020.12.31 දිනට	2019.12.31 දිනට
		(රු)	(රු)
සටහන (2)	**කාර්ය මණ්ඩල ණය**		
	ආපදා ණය	12,344,057	12,872,045
	උත්සව අත්තිකාරම්	2,693,250	123,250
	පොත් ණය	750	750
	සුනාමි ණය	157,297	171,464
		15,195,354	**13,167,510**
සටහන (3)	**තොග 31/12/2020**		
	ලිපි ද්‍රව්‍ය	1,747,782	1,422,223
		1,747,782	**1,422,223**
